# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1825 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 10/12/2024<br>පැය 1605 |

## මාධ්‍ය නිවේදනය

**යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්ජුනා රාමනාදන් මහතා සම්බන්ධයෙන් යාපනය පොලිස් ස්ථානයට සිදු කර ඇති පැමිණිල්ල පිළිබඳව.**

යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ තංගමුත්තු සත්‍යමූර්ති මහතා විසින් 2024.12.09 වන දින උදෑසන කාලයේ යාපනය පොලිස් ස්ථානයට පැමිණ එදින උදෑසන යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්ජුනා රාමනාදන් මහතා රෝහල් අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයට අයුතු ලෙස ඇතුළු වී බැණ තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර ඇත.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්ජුනා රාමනාදන් මහතා රෝහලේ කාර්යය මණ්ඩලයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් තොරතුරු විමසා සිටීමේදී ඒවා ලබා දීම අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසු මෙසේ බැණ වැදී පිටව ගිය බවට වැඩිදුරටත් පැමිණිල්ල මඟින් සඳහන් කර ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් යාපනය මූලස්ථාන පොලිස් ස්ථානය මඟින් ඉදිරි විමර්ශන කටයුතු ආරම්භ කර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් යාපනය ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමට නියමිතය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**